# අතුරු ව්‍යවස්ථා

## වැලිමඩ ප්‍රාදේශීය සභාව

### ප්‍රාදේශීය සභා පනත

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 122 වැනි වගන්තිය යටතේ වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලය ප්‍රකාර ඌව පළාත් සභාවේ ප්‍රාදේශීය පරිපාලන, නීතිය හා සාමය, සැලසුම් හා සැලසුම් ක්‍රියාත්මක කිරීම, මුදල්, අධ්‍යාපන, පළාත් පාලන සහ බෞද්ධ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ජේ. එම්. ඩී. ජයවීර,
ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1996 අගෝස්තු මස 30 වැනි දින,
බදුල්ලේ දීය.

### අතුරු ව්‍යවස්ථා

### මෝටර් වාහන නවතා තැබීම

1. මෙම අතුරු ව්‍යවස්ථා 1996 මෝටර් වාහන නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෝටර් වාහනයක් හෝ යම් නියමිත පන්තියක හෝ වර්ගයක මෝටර් වාහන ගාස්තුවක් ගෙවා (මෙම උපලේඛනයේ සවිස්තරව සඳහන් කර ඇති ) නවතා තැබීම පිණිස (මේ අතුරු ව්‍යවස්ථාවල මින් මතු "පොදු නවතා තැබීමේ ස්ථානය" ) යනුවෙන් සඳහන් කරනු ලබන ස්ථානයක් ලෙස වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ස්ථානයක් සභාපතිවරයා විසින් වෙන් කළ හැකිය.

(2) කිසිම තැනැත්තෙකු විසින් පොදු නවතා තැබීමේ ස්ථානයට මෝටර් වාහනයක් නොවන වෙනත් වාහනයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම හෝ නොකළ යුතුය.

3. සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇත්තේනම් මිස යම් තැනැත්තෙකු විසින් පොදු නවතා තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් නවතා තැබීම නොකළ යුතුය.

4. (1) 03 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද එක් එක් බලපත්‍රය සඳහා මෙහි 'අ' උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති ප්‍රමාණය අනුව ගාස්තුවක් අය කරනු ලැබිය යුතුය.අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ සෑම අවසර පත්‍රයක්ම ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද, ඒ මෝටර් වාහනයේ හඳුනා ගැනීමේ අංකය ඇතුළත් විය යුතු අතර, අවසර පත්‍රයේ සඳහන් කාලසීමාව සඳහා එය වලංගු විය යුතුය.

(2) සෑම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩලයක් නැතහොත් යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි එම දෙපාර්තමේන්තුවට, සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩලයට නැතහොත් තැනැත්තෙකුට අයත් මෝටර් වාහන වෙනුවෙන් සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව මෙහි 'ආ' උපලේඛනයෙහි දක්වා ඇති පරිදි වාර්ෂික අවසර පත්‍රයක් ලබාගනු ලැබිය හැකිය.

5. පොදු නවතා තැබීමේ ස්ථානයක නවතා තබනු ලබන යම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද අවසර පත්‍රය ඉදිරිපත් කරන ලෙස යම් පොලිස් නිලධාරියෙකු හෝ රථවාහන පාලකයෙකු හෝ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරන ලද තැනැත්තෙකු හෝ විසින් ඒ මෝටර් වාහනයේ අයිතිකරුගෙන් හෝ රියදුරුගෙන් හෝ ඉල්ලා සිටින ලද කවර හෝ අවස්ථාවක වුවද ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඒ අයිතිකරු හෝ රියදුරු හෝ විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. යම් පොදු නවතා තැබීමේ ස්ථානයක් යම් නියමිත පංතියක හෝ වර්ගයක මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබූ අවස්ථාවක යම් තැනැත්තෙකු විසින් එම නවතා තැබීමේ ස්ථානයක ඒ පංතියට හෝ වර්ගයට අයත් නොවන යම් මෝටර් වාහනයක් ඇතුල් කිරීම හෝ නවතා තැබීම නොකළ යුතුය.

7. පොදු නවතා තැබීමේ ස්ථානයකට ඇතුළු වන්නා වූ හෝ ඉන් පිටවන්නා වූ වෙනත් යම් වාහනයකට බාධාවන ආකාරයෙන් යම් තැනැත්තෙකු විසින් පොදු නවතා තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් නවතා තැබීම නොකළ යුතුය.

8. පොදු නවත්වා තැබීමේ ස්ථානයක යම් මෝටර් වාහනයක් නවතා තබා ඇති කාලය අතර තුර යම් තැනැත්තෙකු විසින් එය සේදීම හෝ සෝදනු ලැබීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

9. කිසිම තැනැත්තෙකු විසින්,-

(අ) පොදු නවතා තැබීමේ ස්ථානයක නවතා තබා ඇති යම් මෝටර් වාහනයක් අළුත්වැඩියා කිරීම, ඒ පොදු නවතා තැබීමේ ස්ථානයෙන් ඒ වාහනය ඉවත් කිරීමේ කාර්ය සඳහා එසේ අළුත්වැඩියා කිරීම අවශ්‍ය වන්නේ නම් මිස නොකළ යුතුය ;

(ආ) එවැනි යම් අළුත්වැඩියාවක් කිරීමේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී අනවශ්‍ය වන හෝ අසාධාරණ වන යම් ශබ්දයක් නොකළ යුතුය.

10. යම් තැනැත්තෙකු විසින් පොදු නවතා තැබීමේ ස්ථානයක් ඇතුළත යම් අනිසි ආකාරයකින් හැසිරීම හෝ හිරිහැරයක් සිදු කිරීම හෝ නොකළ යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව එක් එක් දිනයෙහි පෙරවරු 07.00 සිට පස්වරු 07.00 දක්වා වූ කාලය සඳහා ක්‍රියාත්මක විය යුතුය.

12. මේ අතුරු ව්‍යවස්ථාවලින් වූ යම් අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු විසින් වරදකරු කරනු ලැබූ විට-

(අ) එම වරද පළමුවරට කරන ලද උල්ලංඝනය සම්බන්ධයෙන් වන විට රුපියල් දෙසීයක් නොඉක්මවන දඩයකින් ද ; සහ

(ආ) එම උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක අධිකරණයක් විසින් ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ ලේකම්වරයා විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම දිනයක් සඳහාම දිනකට රුපියල් පනහකට නොවැඩි අතිරේක දඩයකින් ද

දඬුවම් කරනු ලැබිය යුතුය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථාවල" සභාපතිවරයා" යන්නෙන් වැලිමඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ විශේෂ කොමසාරිස්වරයා සඳහන් වේ.

" ලේකම්" යන්නෙන් වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සඳහන් වේ.

" සභාව " යන්නෙන් වැලිමඩ ප්‍රාදේශීය සභාව අදහස් වේ.

" මෝටර් වාහන "යන්නෙන් මාර්ගවල පාවිච්චි කිරීම සඳහා අදහස් ලද හෝ සකස් කරන ලද යාන්ත්‍රිකව පදවන යම් වාහනයක් අදහස් කෙරෙන අතර, ඊට ට්‍රොලි රථයක් හා ට්‍රේලරයක් සහ ට්‍රැක්ටරයක් ඇතුළත් වන නමුදු -

(අ) දුම්රිය මාර්ග සහ ට්‍රැක් මාර්ග වැනි විශේෂයෙන් සකස් කරන ලද මාර්ගවල පාවිච්චි කරනු ලබන යම් වාහනයක් ;

(ආ) පාර තලන රෝලරයක් වශයෙන් සත්භාවයෙන් පාවිච්චි කරනු ලබන එහෙත් බඩු ගෙනයාමේ කාර්ය සඳහා ට්‍රැක්ටරයක් වශයෙන් පාවිච්චි කරනු නොලබන ආර තලන රෝලරයක් ;

(ඇ) ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ සහ යම් ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයක යම් මෝටර් වාහනයක් ඊට ඇතුළත් නොවේ.

"රථවාහන" පාලක යන්නෙන් සභා ප්‍රදේශය ඇතුළත මෝටර් වාහන නවතා තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහන නවතා තැබීමේදී එසේ නවතා තැබීම සඳහා සභාපතිවරයා වෙනුවෙන් ටිකට්පත් නිකුත් කිරීමට සභාපතිවරයා විසින් බලය දෙන ලද තැනැත්තෙක් අදහස්වේ.

(අ) උප ලේඛනය

4(1) අතුරු ව්‍යවස්ථාව

| | පළමුවැනි පැය හෝ ඉන් කොටසක් සඳහා ගාස්තු | දෙවැනි පැය හෝ ඉන් කොටසක් හෝ සඳහා ගාස්තු | තෙවැනි පැය හෝ අතිරේක සෑම පැයක් හෝ ඉන් කොටසක් සඳහා ගාස්තු |
|---|---|---|---|
| | රු. ශ | රු. ශ. | රු. ශ. |
| (අ) මෝටර් සයිකලයක් සඳහා | 1 0 | 1 50 | 2 0 |
| (ආ) මෝටර් රථයක් හෝ වෑන් රථයක් හෝ ත්‍රීරෝද රථයක් සඳහා | 2 0 | 2 50 | 3 0 |
| (ඇ) බස් රථයක්, මෝටර් කෝච් රථයක් ලොරියක් හෝ ට්‍රැක්ටරයක් සඳහා | 5 0 | 7 50 | 10 0 |

(ආ) උප ලේඛනය

4 (2) අතුරු ව්‍යවස්ථාව

වාර්ෂික අවසර පත්‍ර සඳහා ගාස්තුව

| | රු. ශ. |
|---|---|
| (අ) ලොරියක් හෝ පුද්ගලික බස් රථයක් හෝ මෝටර් කෝච් රථයක් සඳහා | 500 0 |
| (ආ) ටැක්සි රථයක් හෝ වෙනත් මෝටර් රථයක් සඳහා | 300 0 |
| (ඇ) ත්‍රීරෝද රථයක් සඳහා | 250 0 |
| (ඈ) මෝටර් බයිසිකලයක් සඳහා | 100 0 |

09-563

විවිධ

කුරුණෑගල ප්‍ර

ගොඩනැගිලි ඉදිකිරීම